(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

**අංක 1(15).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2024 ජූලි 12 සිකුරාදා**

---

**2024 ජූලි 23 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වගන්තිය සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 12 දිනැති අංක 2366/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.12 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 02/2024 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— ණය සහනදායක ආඥාපනත යටතේ නියෝග,— (81 අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනතේ 63 වගන්තිය සමඟ කියවිය යුතු 6 සහ 10 වගන්ති යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 අප්‍රේල් 22 දිනැති අංක 2381/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.12 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා,— සංචාරක කටයුතු පනත යටතේ නියමය,— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය සහිතව, සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 දෙසැම්බර් 28 දිනැති අංක 2364/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2024 ජූලි 24 බදාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2024 ජූලි 24 බදාදා)**

2146/2024

ගරු අසංක නවරත්න මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හලාවත, මහවැව පදිංචිව සිටි සෝලියස් මැන්දිස් කලාකරුවාට පෞද්ගලිකව අයිති ඉඩම්, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ පාලනයට පවරා දී තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් පවරා ඇති කාල වකවානුව කවරේද;

(iii) එම ඉඩම් පවරා ඇති ක්‍රමවේදය කවරේද;

(iv) ඊට අදාළ අවසාන කැමති පත්‍රය/ඔප්පුව කවරේද;

(v) පවරා ඇති එක් එක් ඉඩමේ නම, විශාලත්වය හා පිහිටා ඇති ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) ඉහත ඉඩම්, සම්මේලනය විසින් පසුකාලීනව අන්සතු කර තිබේද;

(vii) එසේ නම්, ඒ කුමන පදනම් යටතේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පැවරූ දින සිට මේ වනතෙක් ඉහත (අ)(v)හි සඳහන් එක් එක් ඉඩමෙන් වාර්ෂිකව උපයන ලද ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පැවරූ දින සිට මේ වනතෙක් එම ඉඩම්වල සහ ඒවායේ ඇති ගොඩනැගිලිවල දියුණුව හා ආරක්ෂාව සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද;

(iii) සෝලියස් මැන්දිස් මහතාට අයත් මහවැව පිහිටි ඉඩමක ඉදිකර ඇති "සිව්රාජ" ළමා නිවාසය සංවර්ධනය කිරීමට වැඩසටහනක් යෝජනා කර තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2148/2024

ගරු සෙය්යිඩ් අලී සාහිර් මවුලානා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් රාජ්‍ය භාෂා කොමසාරිස්වරයාට දෙමළ භාෂාව හැසිරවීමේ හැකියාව නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාවක් වන දෙමළ භාෂාව භාවිත කරනු ලබන පුරවැසියන්ගේ අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඔහුට අපහසු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, වත්මන් රාජ්‍ය භාෂා කොමසාරිස්වරයා දෙමළ භාෂාව සම්බන්ධයෙන් ලබා ඇති කුසලතාවය කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ සම්බන්ධීකරණ භාෂාව වන ඉංග්‍රීසි භාෂාව සම්බන්ධයෙන් ඔහු ලබා ඇති සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2024 අගෝස්තු 06 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1702/2024

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකා පොලිසියේ, පොලිස් පරීක්ෂක, පොලිස් සැරයන් සහ පොලිස් කොස්තාපල් යන එක් එක් තනතුරේ සේවය කරනු ලබන නිලධාරින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් තනතුරේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත තනතුරුවල සේවය කරනු ලබන නිලධාරින්ට උසස්වීම් ලබාදීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) පොලිස් සැරයන් තනතුරේ සිට පොලිස් පරීක්ෂක තනතුරට උසස් වීම සඳහා ගත වන කාලය කොපමණද;

(v) ශ්‍රී ලංකා පොලිසියට ආධුනික පොලිස් කොස්තාපල්වරුන් බඳවාගැනීමේදී, මේ වනවිට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1730/2024

ගරු ජගත් ප්‍රියංකර මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති කාර්මික ජනපද සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්මික ජනපදයේ ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව සහ උත්පාදනය කර ඇති සෘජු හා වක්‍ර රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සඳහන් කාර්මික ජනපදවල යටිතල හා වෙනත් පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1740/2024

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ඇති රජයේ වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටුවා ඇති ස්ථාන කවරේද;

(iii) ඉහත එක් එක් ගබඩාවේ ගබඩා කළ හැකි වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්ෂ 2015 සිට මේ දක්වා ඉහත ගබඩාවල ගබඩා කරන ලද වී ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් වී ගබඩා අතරින් මේ වනවිට භාවිතයට නොගන්නා වී ගබඩා තිබේද;

(ii) එසේ නම්, එම ගබඩා සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iv) එම ගබඩා නැවත භාවිතයට ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) අම්පාර දිස්ත්‍රික්කයේ ඇති වී ගබඩාවලින් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1752/2024

ගරු ඉෂාක් රහුමාන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති රජයේ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහල්වල සේවය කරනු ලබන වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ ඇති ගිලන්රථ සංඛ්‍යාව කොපමණද;

(iv) එම දිස්ත්‍රික්කයේ ඇති ග්‍රාමීය රෝහල්වල ගොඩනැගිලි පහසුකම් අවම වීම වැනි අඩුපාඩු පවතින බව දන්නේද;

(v) එම අඩුපාඩු මගහරවා ගැනීම සඳහා පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගීන් විශාල සංඛ්‍යාවක් සිටින බව දන්නේද;

(ii) එසේ නම්, ඔවුන්ට ප්‍රමාණවත් සෞඛ්‍ය පහසුකම් ලබා දෙන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1877/2024

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොරගහකන්ද ව්‍යාපෘතිය හේතුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ, එම ව්‍යාපෘතිය අවට පිහිටා ඇති ගම් රැසක ජනතාව වන අලි තර්ජනයට මුහුණ දී සිටින බව දන්නේද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

(iii) එම ගම්මානවල ජීවත් වන මේ වනවිට වන අලි තර්ජනයට මුහුණ දී සිටින පවුල් සංඛ්‍යාව එක් එක් ගම්මානය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම වන අලි තර්ජනය විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1915/2024

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් මේ වනවිට පවත්වාගෙන යනු ලබන ශාඛා අලෙවිසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලෙවිසල් අතරින් වාර්ෂිකව ලාභ ලබන හා අලාභ ලබන අලෙවිසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අලාභ ලබන අලෙවිසල්, ලාභදායී තත්ත්වයට පත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) අලාභ ලබන අලෙවිසල් වසා දැමීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1919/2024

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2019 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ සිදු වී ඇති ළමා අපචාර හා ළමා හිංසන සංඛ්‍යාව සහ කාන්තා අපචාර හා කාන්තා හිංසන සංඛ්‍යාව කොපමණද;

(ii) එම අපචාර/හිංසන අතරින් මේ වනවිට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අතරින් සමථයකට පත් වී ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1944/2024

ගරු මිලාන් ජයතිලක මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නිරත වන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂයකට අපනයනය කරනු ලබන විසිතුරු මත්ස්‍යයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1971/2024

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති කුකුළු ගොවිපළ සංඛ්‍යාව, ඒවායේ සාමාන්‍ය වාර්ෂික බිත්තර නිෂ්පාදනය, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වාර්ෂික බිත්තර පරිභෝජනය සහ වාර්ෂිකව ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන බිත්තර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වෙළඳපොළ තුළ බිත්තර මිල නිරන්තරයෙන් උච්ඡාවචනය වන බැවින් බිත්තර මිල ස්ථාවරව පවත්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2138/2024

ගරු තිස්ස අත්තනායක මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාබේරියතැන්න ග්‍රාම නිලධාරී වසමේ ඇති ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ඉඩමේ පදිංචි වී සිටින පවුල් 235ක්, මාබේරියතැන්න අභ්‍යන්තර ගුවන් තොටුපළ ඉදිකිරීම සඳහා එම ඉඩමෙන් ඉවත් කිරීමට 2015.04.08 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමතිය සහිතව ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බවත්;

(ii) එම තීරණය ක්‍රියාවට නැංවීම මේ වනතෙක් ප්‍රමාද වීම හේතුවෙන් එම ඉඩමේ පදිංචිකරුවන් දැඩි දුෂ්කරතාවයකට පත් වී ඇති බවත්;

(iii) ඉදිකිරීම් කටයුතු හේතුවෙන් නිවාස කිහිපයකට අලාභහානි සිදු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) මෙම ගුවන් තොටුපළ ඉදිකිරීම හේතුවෙන් නිවාස අහිමි වන පුද්ගලයන් සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි විකල්ප ඉඩම් කඩිනමින් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2024 අගෝස්තු 07 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1996/2024

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු අක්කර 14ක විශාලත්වයකින් යුතු ඉඩමක් රජයේ තක්සේරු මුදලට වඩා අඩුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව සේවා සැපයුම් සහ ගබඩා ඉදිකිරීම සඳහා වෙනත් සමාගමකට/ආයතනයකට බදු දීම හේතුවෙන් ඩොලර් මිලියන 73ක අලාභයක් සිදු වන බවත්;

(ii) එහිදී, වසර 35ක උපරිම බදු කාලය වසර 50ක් දක්වා දීර්ඝ කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අලාභයක් සිදු වන බවත්;

පිළිගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2010/2024

ගරු මයන්ත දිසානායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කය තුළ නිරන්තරයෙන් භූ චලන සිදු වන බව දන්නේද;

(ii) එම භූ චලන ඇති වීමට හේතු පරීක්ෂණ මඟින් තහවුරු කර ගෙන තිබේද;

(iii) එසේ නම්, එම පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම භූ චලන හේතුවෙන් පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් සඳහා රජය විසින් ලබා දී ඇති සහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2021/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සමන්තුරේ, කල්මුණේ, පොතුවිල්, එරාවූර් සහ මරදමුණේ යන ස්ථානවල 2014.02.05 දින සිට Privelth Global (Pvt.) Ltd. යන නමින් මූල්‍ය ආයතනයක් පවත්වාගෙන යන ලද බවත්;

(ii) එම ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරන ලද අහමඩ් ෂෙරීම් මුහම්මදු සිහාෆ් (සිහාෆ් ෂෙරීම්) සහ ෆාතිමා ෆර්සානා මාර්කාර් යන අය විසින් පුද්ගලයන් 1400 දෙනෙකුගේ රුපියල් කෝටි 170 කට අධික මුදලක් වංචා කර ඇති බවත්;

(iii) ඉහත සඳහන් අධ්‍යක්ෂවරයා සහ ඔහුගේ පවුලේ අය මේ වනවිට ඉන්දියාවේ සැඟවී සිටින බවත්;

(iv) මේ සම්බන්ධයෙන් කල්මුණේ සහ සමන්තුරේ පොලිස් ස්ථාන වෙත පැමිණිලි කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත පුද්ගලයන් අත්අඩංගුවට ගෙන ශ්‍රී ලංකාවට රැගෙන ඒමට ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2048/2024

ගරු ලලිත් එල්ලාවල මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ, ''නෙළුම් කුලුන'' ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) එහි ඉදිකිරීම් සඳහා විදේශ පරිත්‍යාග ලැබුණෙහිද;

(iii) එසේ නම්, එම මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) කුලුන ඉදිකිරීම සඳහා වැය කරන ලද රාජ්‍ය අරමුදල් ප්‍රමාණය කොපමණද;

(v) එම අරමුදල් ලබා ගන්නා ලද ආයතන කවරේද;

(vi) කුලුන විවෘත කරන ලද දින සිට මේ දක්වා එහි ආදායම සහ වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නෙළුම් කුලුන ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබේද;

(ii) නොඑසේ නම්, අදාළ ඉදිකිරීම් ආයතනය තෝරා ගන්නා ලද ක්‍රමවේදය කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු විදේශ ආයතනයක් විසින් සිදු කරන ලද්දේ නම්, එම ආයතනයේ ශ්‍රී ලාංකීය නියෝජිත කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2057/2024

ගරු වේලු කුමාර් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්බලමාන ග්‍රාම නිලධාරි වසමේ කැණීම් කර්මාන්තයේ නිරත වන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට නිකුත් කර ඇති බලපත්‍ර වර්ගය කවරේද;

(iii) එම ආයතනය විසින් කණිනු ලබන ඛනිජ ද්‍රව්‍ය කවරේද;

(iv) ඉහත ආයතනය විසින් කැණීම් සිදු කරනු ලබන ඉඩමේ ප්‍රමාණය කොපමණද;

(v) එම ඉඩමේ අයිතිකරුවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කැණීම් කටයුතු නියමිත ප්‍රමිතීන්ට අනුව සිදු කර තිබේද:

(ii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

---

**2024 අගෝස්තු 08 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5/2024

ගරු නිතිඟ වසන්ත යාපාබණ්ඩාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ මේ වනවිට ක්‍රියාත්මකව පවතින බලපත්‍ර සහිත කළුගල් කැඩීමේ වැඩබිම් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම වැඩබිම් හේතුවෙන් කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මල්පාන, හීපිටිය, අහස්පොකුණ යන ප්‍රදේශවල ජනතාවට සිදු වන අහිතකර බලපෑම් සම්බන්ධයෙන් අදාළ ප්‍රාදේශීය සභාවට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හා මධ්‍යම පරිසර අධිකාරියට වාර්තා වී තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට කළුගල් කැඩීමේ වැඩබිම් පවතින ප්‍රදේශ ආශ්‍රිතව උද්ගත වී ඇති පාරිසරික ගැටලු හා ඒ හේතුවෙන් ඒවා අවට පදිංචිකරුවන්ට සිදුවන දේපල හානි හා ජීවිත අවදානම සම්බන්ධයෙන් දැනුම්වත් වී තිබේද;

(ii) සමහර වැඩබිම්වල නියමිත ප්‍රමිතියෙන් තොරව කළුගල් කැඩීම සිදු කරනු ලබන බව දන්නේද;

(iii) ඉහත කර්මාන්තය පවත්වා ගැනීමටත්, එම ක්ෂේත්‍රයේ රැකියා සුරක්ෂිත කිරීමටත්, එම වැඩබිම් අවට පදිංචිකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

44/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.01 දින සිට 2023.12.31 දින දක්වා ශ්‍රී ලංකාවේ අලෙවි වී ඇති දුම්වැටි සංඛ්‍යාව සහ ඒ තුළින් රජය විසින් උපයාගෙන ඇති ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දුම්වැටි මිල තවදුරටත් ඉහළ නැංවීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) දුම්වැටි අලෙවිය අධෛර්යමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(v) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

313/2024

ගරු හේෂා විතානගේ මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ විවෘත කරන ලද දිනය කවරේද;

(ii) එදින සිට මේ දක්වා එම ගුවන් තොටුපළෙහි වාර්ෂික ආදායම හා වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ගුවන් තොටුපළෙහි ආදායම අඩු වීම සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

362/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1990 සිට මේ දක්වා පත් කර ඇති ජනාධිපති විමර්ශන කොමිෂන් සභා සංඛ්‍යාව ශ්‍රී ලංකාවේ එක් එක් විධායක ජනාධිපතිවරයා අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කොමිෂන් සභා සංඛ්‍යාව, ජාතික ආරක්ෂාව, ජාතික ආර්ථිකය, අධ්‍යාපනය, මැතිවරණ ප්‍රතිසංස්කරණ සහ දූෂණ අනාවරණය කිරීම යන එක් එක් විෂය ක්ෂේත්‍රය අනුව සහ එක් එක් විධායක ජනාධිපතිවරයා අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i)හි සඳහන් කොමිෂන් සභාවල වාර්තා අනුව අනාවරණය වූ වැරදිකරුවන් හා ඔවුන්ට ලබා දීමට නිර්දේශ කර ඇති දඬුවම් එක් එක් කොමිෂන් සභාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් එක් එක් කොමිෂන් සභාව සඳහා වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කොමිෂන් සභාවල අවසන් වාර්තා මහජනතාවගේ පරිහරණය සඳහා ලබා දී තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) මේ දක්වා අවසන් වාර්තාවක් නිකුත් කර නොමැති කොමිෂන් සභා කවරේද;

(v) එම එක් එක් කොමිෂන් සභාව පත් කරන ලද කාල වකවානුව සහ සාමාජිකයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

371/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ලසාර්ඩ්-ෆ්‍රාන්ස් සමාගමෙන් (M/S Lazards-France) මූල්‍ය උපදේශන සේවා ලබා ගැනීමට ශ්‍රී ලංකා රජය ගිවිසුමකට එළැඹී තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුම අනුව ඉහත සමාගමේ මූලික වගකීම් කවරේද;

(iii) ඉහත ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා රජය විසින් ගෙවිය යුතු මුදල හා මේ වනවිට ගෙවා ඇති මුදල ශ්‍රී ලංකා රුපියල් හා එක්සත් ජනපද ඩොලර් වලින් වෙන් වෙන් වශයෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ක්ලිෆර්ඩ් චාන්ස් (M/S Clifford Chance LLP) සමාගමෙන් නීති උපදේශක සේවා ලබා ගැනීමට ශ්‍රී ලංකා රජය ගිවිසුමකට එළැඹී තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුම අනුව ඉහත සමාගමේ මූලික වගකීම් කවරේද;

(iii) ඉහත ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා රජය විසින් ගෙවිය යුතු මුදල හා මේ වනවිට ගෙවා ඇති මුදල ශ්‍රී ලංකා රුපියල් හා එක්සත් ජනපද ඩොලර් වලින් වෙන් වෙන් වශයෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2079/2024

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා රජය සතු ගුවන්විදුලි නාලිකා සහ රූපවාහිනී නාලිකා මඟින් සජීවී විස්තර ප්‍රචාරයන් සිදු කරනු ලැබූ ආගමික උත්සව සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම උත්සවවල නම් කවරේද;

(iii) ඉහත සඳහන් උත්සව ආවරණය කිරීම සඳහා දරන ලද වියදම කොපමණද;

(iv) එම උත්සව ආවරණය කිරීම වෙනුවෙන් මේ දක්වා අය කර ගෙන ඇති මුදල සහ තවදුරටත් අය වීමට ඇති මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සඳහන් අය වීමට ඇති මුදල, අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2087/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 වර්ෂයේදී ඕස්ට්‍රේලියාවේ පැවති T- 20 ක්‍රිකට් තරඟාවලියේදී සිදු වූයේ යැයි කියනු ලබන සිද්ධි සම්බන්ධයෙන් සොයා බැලීමට පත් කරන ලද පංච පුද්ගල කමිටුවේ සාමාජිකයන් කවුරුන්ද;

(ii) එම කමිටු වාර්තාවට අනුව ඉහත තරඟාවලියේදී සිදු වූයේ යැයි කියනු ලබන සිද්ධි සම්බන්ධයෙන් චෝදනා එල්ල වූ ක්‍රීඩකයන්ගේ හා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරීන්ගේ නම්, තනතුරු නාම, ලිපිනයන් සහ එම එක් එක් ක්‍රීඩකයාට/නිලධාරියාට එරෙහිව ඇති චෝදනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත කමිටුව විසින් ලබා දී ඇති නිර්දේශ කවරේද;

(iv) එම නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2111/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර සම්බන්ධයෙන් පිළිගත් ප්‍රාථමික අලෙවිකරුවන් 14 දෙනා විසින් 2022.06.30 වන දිනෙන් අවසන් වන කාලය සඳහා උපයාගත් ප්‍රාග්ධන ලාභය;

(ii) ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර සම්බන්ධයෙන් 2023.06.30 වන දිනෙන් අවසන් වන කාලය සඳහා එම අලෙවිකරුවන් විසින් උපයාගත් ප්‍රාග්ධන ලාභය;

(iii) 2022.06.30 වන දිනෙන් අවසන් වන කාලසීමාව සඳහා මෙම අලෙවිකරුවන් විසින් උපයා ඇති මුළු ප්‍රාග්ධන ලාභය;

(iv) 2023.06.30 දිනෙන් අවසන් වන කාලසීමාව සඳහා මෙම අලෙවිකරුවන් විසින් උපයා ඇති මුළු ප්‍රාග්ධන ලාභය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2023.06.30 වන දිනෙන් අවසන් වන කාලසීමාව තුළ මෙම අලෙවිකරුවන් විසින් උපයාගත් ප්‍රාග්ධන ලාභවල සැලකිය යුතු වර්ධනයක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) මෙම අනපේක්ෂිත ලාභය සඳහා මෙම අලෙවිකරුවන් විසින් ගෙවන ලද බදු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2149/2024

ගරු රිසාඩ් බදියුදීන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ හැර රජයේ ගුරු පුරප්පාඩු පිරවීම සඳහා 2018.08.31 දිනැති ගැසට් නිවේදනයක් මඟින් අයදුම්පත් කැඳවන ලද අතර, ඒ සම්බන්ධයෙන් විවෘත තරග විභාගයක් 2019 වසරේ පවත්වන ලද බවත්;

(ii) වසර 05ක පමණ දීර්ඝ කාලයකට පසු ඉහත විභාගයේ ප්‍රතිඵල නිකුත් කර ඇති බවත්;

(iii) කෙසේ වෙතත්, සම්මුඛ පරීක්ෂණයේ අවසන් ප්‍රතිඵල මෙතෙක් ප්‍රකාශයට පත් කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පුරප්පාඩු මේ වනවිටත් පුරවා තිබේද;

(ii) එසේ නම්, ඉහත පුරප්පාඩු පුරවන ලද පදනම කවරේද;

(iii) ඉහත සඳහන් විභාගය සමත් වූවන්ගේ වත්මන් තත්ත්වය කවරේද;

(iv) අවසන් සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමේ වත්මන් ප්‍රගතිය කවරේද;

(v) ඉහත පුරප්පාඩු තවමත් පුරවා නොමැති නම්, එම පුරප්පාඩු පිරවීමට නියමිත දිනය කවරේද; සහ

(vi) ඉහත පුරප්පාඩු පුරවනු ලබන පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2150/2024

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 අයවැය යෝජනාවල සඳහන් කර ඇති ‘නාගරික නිවාස හිමිකම’ ලබා දීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) ජාතික නිවාස සංවර්ධන අධිකාරියට සහ නාගරික සංවර්ධන අධිකාරියට අයත් මහල් නිවාස යෝජනා ක්‍රම අතරින් හිමිකම් ඔප්පු ලබා දීමට තෝරාගෙන ඇති නිවාස සංඛ්‍යාව එක් එක් නිවාස යෝජනා ක්‍රමය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මහල් නිවාසවල පදිංචිකරුවන් අතරින් මේ වනවිට හිමිකම් ඔප්පු ලබා දී ඇති පදිංචිකරුවන් සංඛ්‍යාව එක් එක් නිවාස යෝජනා ක්‍රමය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මේ වනතෙක් හිමිකම් ඔප්පු ලබා දී නොමැති මහල් නිවාසවල පදිංචිකරුවන් සඳහා හිමිකම් ඔප්පු ලබා දීමට අපේක්ෂිත දින වකවානු කවරේද;

(v) මහල් නිවාසවල පදිංචිකරුවන් සඳහා හිමිකම් ඔප්පු ලබා දුන් පසු 2024 වර්ෂයේ සිට ඔවුන් බදු හෝ කුලී වාරික ගෙවීමෙන් නිදහස් කරන්නේද;

(vi) මහල් නිවසවල පදිංචිකරුවන් සඳහා හිමිකම් ඔප්පු ලබා දීමේදී නොතාරිස් ගාස්තු, මුද්දර ගාස්තු සහ බදු ඇතුළු ගෙවීම්වලින් ඔවුන් නිදහස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 අගෝස්තු 09 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

383/2024

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත කන්තලේ සීනි සමාගම ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම කර්මාන්තශාලාව ක්‍රියාත්මකව පැවැති කාලයේදී වාර්ෂිකව නිෂ්පාදනය කරන ලද සීනි ප්‍රමාණය සහ ස්ප්‍රීතු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කර්මාන්තශාලාව වසා දමන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වසා දැමීමෙන් පසු එම කර්මාන්තශාලාව ප්‍රතිව්‍යුහගතකරණය සඳහා කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ඉදිරිපත් වූ ආයතනය/ආයතන කවරේද;

(iii) ඒ අතරින් තෝරාගන්නා ලද ආයතනය කවරේද;

(iv) මේ වනවිට එම සීනි කර්මාන්තශාලාවේ තත්ත්වය කවරේද;

(v) එම කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

470/2024

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැළණි ගඟ ස්ථාන රැසකදී අධික පරිසර දූෂණයකට ලක්වන බව දන්නේද;

(ii) එම ස්ථාන හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම ස්ථාන සංඛ්‍යාව හා එම ස්ථානවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කැළණි ගඟ දූෂණය වීම වැළැක්වීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

514/2024

ගරු රෝහණ බංඩාර මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර, පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්කිරියාගම පොලිස් බලප්‍රදේශයේ ''හුරුල්ලැව'' නමින් පුරාවිද්‍යා ස්ථානයක් පවතින බවත්;

(ii) පසුගිය කාලයේදී එම පුරාවිද්‍යා ස්ථානය කිසියම් පිරිසක් විසින් ඩෝසර් කර විනාශ කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම විනාශ කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

545/2024

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2019 සිට මේ දක්වා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ප්‍රචාරණ කටයුතු සිදු කරන ලද එක් එක් ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කාලය තුළ මණ්ඩලය විසින් ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ප්‍රචාරණ කටයුතු සඳහා ආයතනයක් තෝරා ගැනීමේදී මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(iv) ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වැය කරනු ලබන මුදල සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සමස්ත ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(v) ප්‍රචාරණ කටයුතුවලින් පසු වර්ෂ 2019 සිට මේ දක්වා මණ්ඩලයේ ලොතරැයි පත් අළෙවියේ සිදු වූ වර්ධනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

567/2024

ගරු සංජීව එදිරිමාන්න මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ භාවිත වන ඉඩම් ඔප්පු වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඔප්පු වර්ගවල නම් කවරේද;

(iii) රජයේ ඉඩම් නියමානුකූල කිරීම යටතේ වර්ෂ 2019 සිට මේ දක්වා ලබා දී ඇති ඉඩම් ඔප්පු සංඛ්‍යාව සහ ඉදිරියේදී ලබා දීමට නියමිත ඉඩම් ඔප්පු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉදිරියේදී ලබා දීමට නියමිත ඉඩම් ඔප්පු ලබා දීමට නියමිත කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

598/2024

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2017 සිට 2021 දක්වා විදේශ ගත වූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් වර්ෂය අවසානය වනවිට විදේශ ගතව සිටි මුළු ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2020 හා 2021 වර්ෂවලදී නැවත ශ්‍රී ලංකාවට පැමිණි ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2017 සිට 2021 දක්වා විදේශ ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් විසින් මෙරටට එවන ලද විදේශ විනිමය ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව ඇමෙරිකානු ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කාලය තුළදී ඔවුන් විසින් එවන ලද විදේශ විනිමය ප්‍රමාණයෙහි සිදු වූ අඩුවීම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන් විසින් මෙරටට එවන ලද විදේශ විනිමය ප්‍රමාණය අඩුවීමට බලපාන ලද විශේෂ හේතුව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

619/2024

ගරු ජයන්ත සමරවීර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 පෙබරවාරි 14 වන දින පස්වරුවේ කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට ඇමෙරිකා එක්සත් ජනපද ගුවන් හමුදාවට අයත් ගුවන් යානා දෙකක් පැමිණි බව දන්නේද;

(ii) එම ගුවන් යානාවල පැමිණි පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් පුද්ගලයාගේ නම, විදේශ ගමන් බලපත්‍ර අංකය, වීසා බලපත්‍ර අංකය, නියෝජනය කරන ලද ආයතනය සහ තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඔවුන් ශ්‍රී ලංකාවේදී හමු වූ එක් එක් පුද්ගලයාගේ නම, ඔහු/ඇය නියෝජනය කරන ලද ආයතනය සහ තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම හමුවීම්වලදී සාකච්ඡා කරන ලද කරුණු කවරේද;

(vi) එම සාකච්ඡාවලදී එළඹි එකඟතාවයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

635/2024

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2023 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සිදු කර ඇති මනුෂ්‍ය ඝාතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇති සැකකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අතරින් නඩු පවරා ඇති සැකකරුවන් සංඛ්‍යාව කොපමණ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2023 වර්ෂය තුළ අත්අඩංගුවට ගෙන ඇති මත්ද්‍රව්‍ය ප්‍රමාණය කොපමණද;

(ii) එම මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ශ්‍රී ලංකා පොලිසිය විසින් ක්‍රියාත්මක කර ඇති යුක්තිය වැඩසටහනේ ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1095/2024

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති මිනිරන් පතල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන මිනිරන් ප්‍රමාණය කොපමණද;

(iv) එම මිනිරන් අපනයනය කරනු ලබන රටවල් කවරේද;

(v) දේශීය නිෂ්පාදන සඳහා මිනිරන් භාවිත කරන්නේද;

(vi) එසේ නම්, එම නිෂ්පාදන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1227/2024

ගරු කුමාරසිරි රත්නායක මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ඩිපෝවේ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව එක් එක් තනතුරු නාමය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් ඩිපෝවේ මේ වනවිට ධාවන තත්ත්වයේ පවතින බස් රථ සංඛ්‍යාව, අලුත්වැඩියා කිරීමෙන් පසු ධාවනයට එක් කළ හැකි බස් රථ සංඛ්‍යාව සහ අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පවතින බස් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 2/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල ශිෂ්‍ය/ශිෂ්‍යාවන් විසින් කරනු ලබන පර්යේෂණ නිබන්ධන අදාළ අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කරගනිමින් සකස් කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට පවතින විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලබන සිසුන් විසින් හදාරනු ලබන පාඨමාලා සම්බන්ධයෙන් සිදු කරනු ලබන පර්යේෂණ නිබන්ධන ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික වර්ධනයට අදාළව සිදු කිරීම වැදගත් වන හෙයින් ද, මෙම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරුන් හා එකී පර්යේෂණ නිබන්ධනවලට අදාළ අමාත්‍යාංශය අතර මනා

සම්බන්ධීකරණයක් සිදු කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශ මට්ටමින් වගකිව යුතු නිලධාරියකු පත් කළ යුතු හෙයින් ද, අදාළ අමාත්‍යාංශයන් හි ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කිරීමේ දී දිගුකාලීන, මධ්‍යකාලීන සහ කෙටිකාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා එකී නිබන්ධන යොදා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.3/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— ලොව පුරා ඇති බෞද්ධ සිද්ධස්ථාන රැක ගැනීමට පෙරමුණ ගැනීම,— ලොව පුරා සිටින බෞද්ධයන්ගේ වන්දනාවට පාත්‍රවන බෞද්ධ සිද්ධස්ථානවල ආරක්ෂාව තර කිරීමට හා අන්තර්ජාතික වශයෙන් බෞද්ධයන් වෙනුවෙන් හඬක් නැඟිය හැකි ශක්තිමත් සංවිධානයක් ගොඩනැගීම සඳහා ලොව පුරා සිටින බෞද්ධ නායකයන් හා සංවිධාන ඒකරාශී කිරීමට ශ්‍රී ලංකාව මූලිකත්වය ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල දිවයින පුරා ව්‍යාප්ත කිරීම,— ජීවිතයේ සැඳෑ සමය ගත කරමින් සිටින වැඩිහිටියන්ට තම පවුලේ සාමාජිකයන්ගෙන් මෙන්ම ඇතැම් ආයතනවලින් නොසලකා හැරීම් නිසා සිදුවන විවිධ අසාධාරණ සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩපිළිවෙළ පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය ඔස්සේ අළෙවි කිරීම මඟින් සිදු කරන ඖෂධ ජාවාරම මැඩපැවැත්වීම,— වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවණ්‍ය නිෂ්පාදන විශාල ලෙස අළෙවි කරන බැවින් ද, මෙය අප රටේ ජනතාවගේ ජීවිතාරක්ෂාවට විශාල තර්ජනයක් වන බැවින් ද, මෙම තත්ත්වය මැඩපවත්වා ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් රජය විසින් සකසා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— ණය ක්‍රමයක් මඟින් වැඩිහිටි ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවෙහි ජීවනෝපාය මාර්ග ශක්තිමත් කර දීමෙන් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ඔවුන්ව දායක කර ගත හැකි වන හෙයින් ද, මෙම වැඩිහිටි ප්‍රජාව සඳහා බැංකු පද්ධතිය මඟින් ණය පහසුකම් ලබා නොදීම හේතුවෙන් ඔවුන්ට සමාජය තුළ වෙනස්ව සැලකීමක් සිදුවන හෙයින් ද, බැංකු පද්ධතිය මඟින් වයස අවුරුදු 60 ඉක්මවන්නන් හට ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ඉතිහාසය පිළිබඳ ග්‍රන්ථයක් එළිදැක්වීම,— මානව පරිණාමයේ සිට පුරාවිද්‍යාව, සාහිත්‍යය, ජනශ්‍රැතිය, රෝම, ග්‍රීක හා පර්සියානු ඉතිහාසය අධ්‍යයනය කොට ශ්‍රී ලාංකික ඉතිහාසය පිළිබඳ ග්‍රන්ථයක් ප්‍රවීණ කර්තෘ මණ්ඩලයක් යටතේ රාජ්‍ය අනුග්‍රහයෙන් එළිදැක්වීමට රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/2024

ගරු හේෂා විතානගේ මහතා,— රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම,— රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ප්‍රතිලාභ රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නොව බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ජනතාවට ද ලැබෙන හෙයින් රටේ පවතින ආර්ථික දුෂ්කරතා හමුවේ වුව ද විශාල ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට හැකියාව ඇති මෙම ව්‍යාපෘති අඛන්ඩව කොටස් වශයෙන් හෝ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/2024

ගරු හේෂා විතානගේ මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සළකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, හම්බනේතාට සහ බදුල්ල ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට භුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/2024

ගරු හේෂා විතානගේ මහතා,— කඩා වැටුණු මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම,— රටක ආර්ථික සංවර්ධනය හා මූල්‍ය වෙළඳපොළ කෙරෙහි සුවිශේෂී බලපෑමක් මූල්‍ය ආයතන හරහා සිදුවුවත්, පසුගිය කාලය පුරා මෙරට මූල්‍ය ආයතන කිහිපයක් කඩා වැටීමකට ලක් වී ඇති හෙයින් ද, එහි තැන්පතුකරුවන් පොදුවේ ප්‍රශ්න රාශියකට මුහුණ පා සිටින හෙයින් ද, එම මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2024

ගරු හේෂා විතානගේ මහතා,— දේශීය ටින්මාළු නිෂ්පාදනය වැඩි කිරීම,— ශ්‍රී ලංකාව වටා මුහුද තිබියදී රටට අවශ්‍ය ටින්මාළු ආනයනය සඳහා වාර්ෂිකව විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී යන හෙයින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය ටින්මාළු කර්මාන්තය දියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට රජය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/2024

ගරු හේෂා විතානගේ මහතා,— පළාත් පාලන ආයතනවල අබලන් වූ වාහන අලුත්වැඩියා කිරීම,— පළාත් පාලන ආයතන බොහොමයකම අබලන් තත්ත්වයේ පවතින වාහන ගාල් කර ඇති ආකාරය ඉතා සුලභ දසුනක් වන හෙයින් ද, එම ආයතන සඳහා අලුතින් වාහන මිල දී ගැනීම වෙනුවට එම වාහන අලුත්වැඩියා කිරීම තුළින් විශාල මුදලක් ඉතිරි කර ගත හැකි හෙයින් ද, පළාත් පාලන ආයතනවල අබලන් වී ඇති වාහන අලුත්වැඩියා කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2024

ගරු හේෂා විතානගේ මහතා,— විදේශගත ශ්‍රමිකයන්ට සුබසාධනය සැලසීම,— ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ලබාදීමට උරදෙන විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල සුබසාධනය සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2024

ගරු හේෂා විතානගේ මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 'බ්‍රේල්' ක්‍රමයට හා 'ශ්‍රවණ' (Audio) ආකාරයට සකස් කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඕනෑම රටක මූලික නීතිය හා රාජ්‍යයේ මූලික ආකෘතිය වන හෙයින් ද, මිලියන විසිදෙකකට ආසන්න වූ ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් මිලියන දෙකකට ආසන්න ප්‍රමාණයක් ආබාධ සහිත ප්‍රජාව වන හෙයින් ද, ආබාධ ප්‍රජාව අතරින් ද ලක්ෂ හයකට ආසන්න ප්‍රමාණයක් ශ්‍රවණාබාධ සහ දෘශ්‍යාබාධ සහිත පුරවැසියන් වන හෙයින් ද, රටේ මූලික නීතිය පිළිබඳ දැනීමක් හා අවබෝධයක් ලබාගැනීම සඳහා මෙම ශ්‍රවණ සහ දෘශ්‍යාබාධ සහිත ප්‍රජාව සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 'බ්‍රේල්' ක්‍රමයට හා 'ශ්‍රවණ' (Audio) ආකාරයට සකස් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— 50% බැගින් ජාතික කුසලතාවට අදාළව සහ පාසැල් පදනමට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසු සිසුවියන් තෝරා ගැනීමේ දර්ශකය වන Z-අගය (Z- Score) ගණනය කිරීම,— අ.පො.ස. උසස් පෙළ සමත් සිසු සිසුවියන් අතරින් කලා පීඨ හැර අනෙකුත් විශ්වවිද්‍යාල පීඨ සඳහා සිසුන් බඳවා ගැනීමේ පදනම හා දර්ශකය Z-අගය මත සකස් කර ඇති හෙයින් ද, මෙම ක්‍රමවේදයට අනුව Z-අගයෙන් 40% ක් ජාතික කුසලතාව (national Merits) මත පදනම්ව ද 55% ක් දිස්ත්‍රික් පදනම (district basis) මත පදනම්ව ද 5% ක් අති දුෂ්කර දිස්ත්‍රික්ක (remote districts) මත පදනම්ව ගණනය කරනු ලබන හෙයින් ද, ඕනෑම දිස්ත්‍රික්කයක ඇති සියලුම පාසැල් සඳහා සමාන ලකුණු මට්ටමක් හෝ අගයක් ආදේශ කිරීම යුක්ති සහගත හෝ සාධාරණ නොවන හෙයින් ද, දිස්ත්‍රික්ක හා අති දුෂ්කර දිස්ත්‍රික්ක පදනම වෙනුවට පාසැල් පදනම වශයෙන් ආදේශ කොට පාසැල් පද්ධතිය තුළ ඇති උසස් පෙළ විෂය ධාරාවන් සහිත පාසැල් තුන්දහස් හතලිස් දෙක (3042) කාණ්ඩ කිහිපයකට වර්ගීකරණය කොට විශ්වවිද්‍යාල ජාතික කුසලතාවට අනුව 50% ක් ද පාසැල් පදනමට අදාළව 50% ක් ද වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා Z-අගය ගණනය කිරීමට රජය විසින් පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— පුද්ගල නාමකරණය ප්‍රසිද්ධියේ ශබ්ද නගා සිදු කරන අවස්ථාවලදී මුල් නම සමඟ වාසගමේ මූලික සංකේත අකුරු හෝ ජාතික හැඳුනුම්පත් අංකය පමණක් සඳහන් කිරීම,— ශ්‍රී ලාංකික සිංහල සමාජයේ පුද්ගල නාමකරණයේ දී වාසගම බොහෝවිට යෙදී ඇත්තේ වැඩවසම් සමාජය තුළ තිබූ රාජකාරි සහ රාජ මෙහෙවරට පසුබිම්ව වන හෙයින් ද, ඇතැම් වාසගම් යෙදී ඇත්තේ මෙම රාජකාරිවලට අදාළ කුලය ඉස්මතු වන හෙයින් ද, අධිකරණ කටයුත්තකට හෝ මැතිවරණයක දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්ද දායකයා කැඳවන විටදී හෝ විශ්වවිද්‍යාල උපාධි ප්‍රදානෝත්සවයක දී උපාධි අපේක්ෂකයා කැඳවන විට දී හෝ පුද්ගල නාමකරණය ප්‍රසිද්ධියේ ශබ්ද නගා සිදු කරන අවස්ථාවලදී මුල් නම සමඟ වාසගම ශබ්ද නගා ප්‍රකාශ කිරීම හේතුවෙන් බොහෝ පුද්ගලයන් දැඩි අපහසුතාවයට පත්වන හෙයින් ද, වර්තමාන පරම්පරාව විසින් ප්‍රතික්ෂේප කරන නූතන ලෝකයට ආදේශ කළ නොහැකි මෙම නීතිය, සිරිත හෝ සම්ප්‍රදාය ඉවත් කොට ජනතාව ඉදිරියේ පුද්ගල නාමකරණය ප්‍රසිද්ධියේ ශබ්ද නගා සිදු කරන අවස්ථාවලදී මුල් නම සමඟ වාසගමේ මූලික සංකේත අකුරු හෝ ජාතික හැඳුනුම්පත් අංකය පමණක් සඳහන් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යාපීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම උදෙසා 2023 වර්ෂය වනවිට පාසැල් පද්ධතියේ සියලුම ගුරුවරුන් පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කිරීමට අවශ්‍ය වන හෙයින් ද, වර්තමානයේ බහුතරයක් ගුරුවරුන් හට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක් හිමිවන හෙයින් ද, වසර තුනක න්‍යායාත්මක පාඨමාලාවක් සහ එක් වසරක පාසැල් කේන්ද්‍රීය පුහුණුවක් සහිත සිව් වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සඳහා උචිත වන සේ දැනට ක්‍රියාත්මක අධ්‍යාපන විද්‍යාපීඨ දහනවය විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීමට අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් 2020 පෙබරවාරි 13 දින මවිසින් ඉදිරිපත් කොට අනුමතිය ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— සියලුම මහජන නියෝජිත ආයතනවලට නියෝජිතයන් තෝරා පත් කර ගැනීමේ දී අවම වශයෙන් 5% ක නියෝජනයක් ආබාධ සහිත පුරවැසියන්ට ලබා දීම,— ශ්‍රී ලංකාවේ අවසන් වරට පවත්වනු ලැබූ ජන සංගණනයට අනුව මෙරට ආබාධ සහිත ප්‍රජාව මුළු ජනගහනයෙන් 8% ඉක්මවා ගොස් ඇති හෙයින් ද, ග්‍රාමීය පරිපාලනය සිදුවන පළාත් පාලනයේ සිට ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබන පාර්ලිමේන්තුව දක්වා මහජන නියෝජිත ආයතනවලට ආබාධ සහිත ප්‍රජාව තේරී පත්වීමට අල්ප අවකාශයක් හිමි ව ඇති හෙයින් ද, ආබාධ සහිත මෙරට පුරවැසියන්ට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය සිදුව ඇත්තේ ද සිදුවන්නේ ද දියුණු රටවල සංකල්පවලට අනුව නොවන හෙයින් ද, සියලුම මහජන නියෝජිත ආයතනවලට නියෝජිතයන් තෝරා පත් කර ගැනීමේ නාම යෝජනා සැකසීමේ දී අවම වශයෙන් 5% ක නියෝජනයක් ආබාධ සහිත පුරවැසියන්ට හිමිවන සේ රජය විසින් අදාළ පනත් හා නීති සංශෝධනය කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන හෝ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවකාශ සලසා දීම,— ශ්‍රී ලංකාවේ ඕනෑම ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ මූලික අධ්‍යාපන සුදුසුකම් හෝ Z- අගය මත පදනම් නොවී ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය නෛතික හා උසස් අධ්‍යාපනික ව්‍යුහය රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— නිල්වලා ගඟ සංවර්ධන ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම,— 1980 දශකයේ දී ආරම්භ කරන ලද නිල්වලා ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සම්පූර්ණ කිරීමට නොහැකිවීම හේතුවෙන් මාතර දිස්ත්‍රික්කයේ හා නිල්වලා නිම්නයේ ජීවත්වන ජනතාවගේ දෛනික ජීවිතය හා ආර්ථිකය බරපතල අර්බුදයකට පත්වී ඇති හෙයින් ද, ඌරුබොකු ඔය සහ කිරම ආර හම්බන්තොට ශුෂ්ක කලාපයට හැරවීම, පහළ නිම්නයේ බටුවිට ජලාශය, අතුරලිය ජලාශය, කඩවැද්දුව ජලාශය සහ දෙදියගල ජලාශය නිර්මාණය කිරීම සහ ආරක්ෂිත කලාපය හා අනාරක්ෂිත කලාප පිළිබඳ නැවත අධ්‍යයනය කොට අත්හරින ලද වෙළි (bunts) නැවත ඉදිකිරීම ප්‍රමුඛ කොටගත් මාතර හා හම්බන්තොට ප්‍රදේශවලට සෘජුවම බලපාන නිල්වලා ගඟ සංවර්ධන ව්‍යාපෘතියේ මූලික සැලසුම් රජය විසින් කඩිනමින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/2024

ගරු වේලු කුමාර් මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබාගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/2024

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට වතු ආශ්‍රිත ප්‍රදේශවල ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීම,— ශ්‍රී ලංකාව ක්‍රිකට් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වූ රටක් වන හෙයින් ද, පසුගිය කාලය පුරාවටම ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රියාකාරකම් අස්ථාවර තත්ත්වයක පැවති හෙයින් ද, ඉතා දක්ෂ ක්‍රීඩකයන් බොහොමයක් සිටින වතු ප්‍රදේශවලට ද ක්‍රිකට් ක්‍රීඩාව පුහුණුවීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමෙන් ඔවුන්ගේ දායකත්වය ද ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩාවේ දියුණුව උදෙසා ලබා ගැනීමට විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/2024

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට ප්‍රජාවගේ පාරම්පරික කලා ශිල්ප වාණිජ කටයුත්තක් දක්වා වර්ධනය කිරීම,— වැවිලි ක්ෂේත්‍රය කේන්ද්‍ර කොටගත් ඉන්දියානු සම්භවයක් සහිත කඳුරට ප්‍රජාව ශ්‍රී ලංකාවේ සමස්ත ජන සමාජය නියෝජනය කරනු ලබන එක් ජන කොටසක් වන හෙයින් ද, නාඩගම්, කොහොඹකළේ නැටුම, කාවඩි නැටුම්, ලී කෙළි වැනි අංගයන්ගෙන් යුත් පාරම්පරික කලා ශිල්ප මෙම ජන සමාජය තුළ දක්නට ලැබෙන හෙයින් ද, එම කලා ශිල්ප ආරක්ෂා කොට වාණිජමය කටයුත්තක් දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීමට රජය විසින් යෝග්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපිත කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/2024

ගරු වේලු කුමාර් මහතා,— ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ප්‍රමිතියක් හා නියාමනයක් ඇති කිරීම,— දිවයිනේ බොහෝ ප්‍රදේශවල පෞද්ගලික පාර්ශ්වයන් විසින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන හෙයින් ද, වතු සමාගම් මඟින් පවත්වාගෙන යනු ලබන මෙවැනි මධ්‍යස්ථානවල නිසි ප්‍රමිතියක්, ක්‍රමවේදයක් හා නියාමනයක් සිදු නොවන හෙයින් ද, රටේ අනාගතය තීරණය කරන දරුවන්ගේ ආරක්ෂාව සහ සුබසාධනය උදෙසා එම මධ්‍යස්ථානවල නිසි ප්‍රමිතියක් සහ නියාමනයක් ඇති කිරීම සඳහා රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/2024

ගරු වේලු කුමාර් මහතා,— මධ්‍යම පළාතේ වන වගා ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ජල පෝෂිත ප්‍රදේශ මධ්‍යම කඳුකර කලාපවල විශේෂයෙන්ම මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල පිහිටා ඇති හෙයින් ද, එම පෝෂිත ප්‍රදේශ පයිනස් වගාව හේතුවෙන් දැඩි බලපෑමකට ලක්වී තිබෙන හෙයින් ද, වන වගාවට පයිනස් ගස් සිටුවීම සම්පූර්ණයෙන් නතර කළ යුතු හෙයින් ද, ඒවා ගලවා ඉවත් කර මීට විකල්පයක් ලෙස ස්වභාවික වන වගා ක්‍රමය දියත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/2024

ගරු වේලු කුමාර් මහතා,— කඳුකර වතු ජනතාවට පානීය ජල සැපයුම ලබාදීම,— කඳුකරයේ වතු ආශ්‍රිත ප්‍රදේශවල පානීය ජලය ලබාදීමේ සැලසුම් නිසි ආකාරයට ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය ස්වභාවික ජල උල්පත්, ගංගා, ඇළ දොළ හා ළිං මඟින් සම්පූර්ණ කර ගන්නා හෙයින් ද, දැනට පවතින ජනගහනය ඉහළ යෑම හා කෘෂි රසායනික ද්‍රව්‍යවල අධික භාවිතය නිසා සිදුවී තිබෙන පරිසර දූෂණය හේතු කොටගෙන, භාවිතයට සුදුසු ජලය ලබාගත නොහැකි තත්ත්වයක් උද්ගතව තිබීමෙන් එම ජනතාවට නොයෙකුත් සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දීමට සිදු වී ඇති හෙයින් ද, වතු ප්‍රදේශවල තිබෙන ජලය පිට පළාත්වලට රැගෙන යෑම නිසා ජල හිඟයක් ඇති වී තිබෙන හෙයින් ද රටේ අනෙකුත් ප්‍රදේශවල ක්‍රියාත්මක වන

පානීය ජල සැපයීමේ වැඩසටහන් මෙම ප්‍රදේශවල ද ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කරමින් රජයේ පානීය ජලය ලබා දීමේ වැඩපිළිවෙළට වතු ප්‍රදේශද ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/2024

ගරු වේලු කුමාර් මහතා,— වතු ආශ්‍රිතව පවතින මාර්ග රජයට පවරා ගැනීම,— ශ්‍රී ලංකාව තුළ වැවිලි ක්ෂේත්‍රයට සුවිශේෂී ස්ථානයක් හිමි වී තිබෙන අතර වතුවල අයිතිය, කළමනාකරණය සහ පරිපාලනය විවිධ කාලයන්හිදී වෙනස්වීම්වලට ලක්වන හෙයින් ද, වතු කම්කරුවන්ගේ වාසස්ථාන ප්‍රධාන මාර්ගයේ සිට බොහෝ දුරස්ව වතු මධ්‍යයේ පිහිටා ඇති හෙයින් ද, මෙම ජනතාව භාවිතා කරන වතු මාර්ග සංවර්ධනය නොකර ඉතා අබලන් තත්ත්වයක පවතින හෙයින් ද, මෙකී මාර්ග පළාත් පාලන හා පළාත් සභා මාර්ග යටතට පැවරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

..

පා. 38/2024

ගරු වේලු කුමාර් මහතා,— ශ්‍රී ලංකාවේ තැපැල් සේවය වැවිලි ක්ෂේත්‍රය තුළ විධිමත් කිරීම,— 1798 වර්ෂයේදී ආරම්භ කරන ලදුව 1882 වර්ෂයේදී ඉංග්‍රීසීන් විසින් විධිමත් කරන ලද වසර දෙසීයකට අධික ඉතිහාසයක් සහිත ශ්‍රී ලංකා තැපැල් සේවය අප රට තුළ නිදහසින් පසුව තැපැල් දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යන රජය විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවක් වන හෙයින් ද, කඳුරට වතුකර ජනතාව මෙරට පදිංචි වී වසර දෙසීයක පමණ කාලයක් ගත වී ඇතත් ඔවුන් පදිංචි නිවාස වෙත සෘජුව ලිපි රැගෙන ගොස් භාර දීමක් සිදු නොවන හෙයින් එම ජනතාව විවිධ අපහසුතාවන්ට පත් වී සිටින හෙයින් ද, අවුරුදු දෙසීයක කාලයක් වැවිලි ක්ෂේත්‍රයේ නියැලෙන මෙම ජනතාව වෙනුවෙන් තැපැල් සේවාව විධිමත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

..

පා. 39/2024

ගරු රෝහණ බංඩාර මහතා,— ඩිජිටල් අධ්‍යාපන ක්‍රමයට අවශ්‍ය මූලික පදනම සකස් කිරීමට වැඩසටහනක් සකස් කිරීම,— වර්තමානය වනවිට ලෝකය ඉතා සීඝ්‍රයෙන් වෙනස් වන පසුබිමක පවතින හෙයින් ඊට අනුරූපව අධ්‍යාපන ක්‍රමය ද වෙනස් විය යුතු හෙයින් ශ්‍රී ලංකාව තුළ ද ඩිජිටල් අධ්‍යාපන ක්‍රමය සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීමට රජය විසින් සුදුසු වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලමේන්තුව යෝජනා කරයි.

..

පා. 41/2024

ගරු රෝහණ බංඩාර මහතා,— සමුපකාර ග්‍රාමීය බැංකුවල තැන්පත්කරුවන්ගේ තැන්පතු ආරක්ෂා කිරීම,— සමුපකාර ව්‍යාපාරයට සම්බන්ධ ග්‍රාමීය සමුපකාර බැංකු කෙරෙහි ග්‍රාමීය ජනතාවගේ විශ්වාසය ඉහළ මට්ටමක පැවතිය ද විවිධ ගැටලු හේතුවෙන් දෙහිවල-ගල්කිස්ස සමුපකාර ග්‍රාමීය බැංකුව, මහරගම සමුපකාර ග්‍රාමීය බැංකුව වැනි ග්‍රාමීය බැංකු මේ වනවිට බිඳ වැටී ඇති හෙයින් ඉතා අසීරු තත්ත්වයකට පත් වී ඇති එහි තැන්පත්කරුවන්ට සාධාරණය ඉටු කිරීම සඳහා සුදුසු වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 42/2024

ගරු රෝහණ බංඩාර මහතා,— සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ඵලදායීව ආයෝජනය කිරීම,— පෞද්ගලික අංශයේ සේවකයන්ගේ සුබසාධනය උදෙසා පිහිටුවා ඇති සේවක අර්ථසාධක අරමුදල සතු මුදල්, කොටස් වෙළඳපොළ තුළ ලැයිස්තු ගත නොකළ සමාගම්වල ආයෝජනය කිරීම තුළින් කිසිදු ප්‍රතිලාභයක් අත් වී නොමැති බවට ජාතික විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති හෙයින්, පෞද්ගලික අංශයේ සේවකයන්ට වැඩි ප්‍රතිලාභ අත්වන පරිදි එම අරමුදල් ඵලදායී ක්ෂේත්‍රවල ආයෝජනය කිරීමට රජය විසින් සුදුසු වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

.

පා. 43/2024

ගරු රෝහණ බංඩාර මහතා,— දුම්රිය දෙපාර්තමේන්තුව තුළ කාලීන වෙනස්කම්වලට ඔරොත්තු දිය හැකි ආයතන ව්‍යුහයක් සකස් කිරීම,— සීඝ්‍රයෙන් තාක්ෂණය වෙනස් වෙමින් පවතින ලෝකයේ, අධිරාජ්‍යවාදීන්ගේ සමයේ හඳුන්වා දුන් දෙපාර්තමේන්තු රාමුව යටතේ දුම්රිය දෙපාර්තමේන්තුව තවදුරටත් පවත්වාගෙන යා නොහැකි හෙයින්, එම දෙපාර්තමේන්තුව තුළ කාලීන වෙනස්කම්වලට ඔරොත්තු දිය හැකි ආයතන ව්‍යුහයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

.

පා. 44/2024

ගරු රෝහණ බංඩාර මහතා,— මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම,— ලිවීමට සහ කියවීමට ඇති හැකියාව හෙවත් සාක්ෂරතාවය ශ්‍රී ලංකාවේ ඉහළ අගයක පැවතුන ද, මූල්‍ය සාක්ෂරතාවය තවමත් පහළ අගයක පවතින හෙයින්, පාසල් අවධියේ සිටම මූල්‍ය සාක්ෂරතාවය ජනගත කිරීම සඳහා සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 46/2024

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,— දේශපාලන පක්ෂවල නිලධාරි මණ්ඩල තුළ කාන්තාවන්ගේ නියෝජනය ඉහළ නැංවීම,— දේශපාලනය තුළ කාන්තා සහභාගිත්වය සහ පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය ඉහළ දැමීමේ සාකල්‍ය ප්‍රවේශයක් ලෙස සෑම ලියාපදිංචි දේශපාලන පක්ෂයක් විසින්ම ස්වකීය විධායක කාරක සභාවේ තීරණ ගැනීමේ මට්ටම/ ධාරිතාව තුළ අවම වශයෙන් 30%ක් කාන්තාවන් පත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---